| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර ඇගයීම - 2025 |
| **7 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 2 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,
   i. පංච ශීලය ii. අට සීලය
   iii. ආජීව අෂ්ටමහ ශීලය iv. දස ශීලය

2) බුදු රජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ,
   i. ආනන්ද හිමිට ii. සැරියුත් හිමිට
   iii. මුගලන් හිමිට iv. සිගාල ගෘහපතිට

3) කිසියම් සමාජයක අන්‍යෝන්‍ය උපකාරය සහයෝගය ඇතිව සමගියෙන් ජීවත්වීම හැඳින්වෙන්නේ,
   i. සමානාත්මතාව ලෙසයි ii. සහජීවනය ලෙසයි
   iii. කරුණාව ලෙසයි iv. මෛත්‍රිය ලෙසයි

4) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරුන් දක්වා ඇති දිශාව වන්නේ,
   i. උතුරු දිශාව ii. බටහිර දිශාව
   iii. දකුණු දිශාව iv. නැගෙනහිර දිශාව

5) "ගුරුසිත නොරිදවා - වේලාව නොවරදවා " යන කවිය ඇතුළත් වන්නේ,
   i. ගුත්තිල කාව්‍යයේ ය ii. කාව්‍යශේඛරයේ ය
   iii. ලෝවැඩ සඟරාවේ ය iv. කව්සිළුමිණෙහි ය

6) කුඹුරු වලින් අස්වනු නෙළීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම හැඳින්වෙන්නේ,
   i. හීල් දානය ලෙසය ii. පේරු දානය ලෙසය
   iii. ආමිස දානය ලෙසය iv. අග්‍රශෂ්‍ය දානය ලෙසය

7) මත්ද්‍රව්‍ය භාවිතයෙන් පුද්ගලයාට ශාරීරිකව සිදුවන අයහපත් ප්‍රතිඵලයන් වන්නේ,
   i. තමා සතු ධන සම්පත් අහිමි වීම ii. ලජ්ජා භය නැති වීමයි
   iii. ලෙඩ රෝග වලට ලක්වීමයි iv. අපකීර්තියට පත්වීමයි

8) දස පුණ්‍ය ක්‍රියාවන් හි "වෘද්ධාපචායන" ලෙස හඳුන්වන්නේ,
   i. වැඩිහිටියන්ට සැළකීමයි ii. පූජ්‍ය පක්ෂයට සැළකීමයි
   iii. දෙමාපියන්ට සැළකීමයි iv. අසරණයන්ට සැළකීමයි

9) අලුත් සහලින් දානය පිළියෙල කොට දෙවියන්ට පුදන කොටස හැඳින්වෙන්නේ,

i. අග්‍රශෂ්‍ය දානය ලෙසය
ii. අක්කියාල ලෙසය
iii. පේරු දානය ලෙසය
iv. ආමිස දානය ලෙසය

10) "වෛරයෙන් වෛරය නොසන්සිඳේ " යන ධම්මපද ගාථාව දේශනා කළේ,

i. නන්ද තෙරුන් අරඹයා ය
ii. ආනන්ද තෙරුන් අරඹයා ය
iii. ථුල්ලතිස්ස තෙරුන් අරඹයා ය
iv. සැරියුත් තෙරුන් අරඹයා ය

- **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 11) බුදු රජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය | පත්තකම්ම සූත්‍රය |
| 12) උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැයකළ යුතු බව දැක්වෙන්නේ | දම්සත් පැවතුම් සූත්‍රය |
| 13) බුදු රජාණන් වහන්සේගේ අගසව් දෙනම | පඨමංබෝධි පල්ලංකං |
| 14) බුදු රජාණන් වහන්සේගේ දේවාචිත උපාසකවරු වන්නේ | සැරියුත් , මුගලන් හිමිවරු |
| 15) සත්සති වන්දනා ගාථාව වනුයේ | තපස්සු භල්ලුක |

- **නිවැරදි පිළිතුර යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

16) කළගුණ සැළකීමේ අගය දැක්වෙන ජාතක කතාව ………………………… ජාතක කතාවයි.

17) තම අන්ධ දෙමාපියන්ට හොඳින් සැළකූ පුතෙකු පිළිබඳ ………………….. ජාතකයෙන් කියැවේ.

18) බෞද්ධයාගේ අත්පොත …………………………… යි.

19) පිදිය යුත්තන් පිදීම මංගල කරුණක් ලෙස …………………………… සූත්‍රයේ දැක්වේ.

20) පස්වග මහනුන් …………………………… සූත්‍රය ඇසීමෙන් රහත් භාවය ලැබූහ.

**( සාම , ධම්ම පදය, අනන්ත ලක්ඛණ , මහා මංගල , ගුණ , අපණ්ණක , දම්සක් පැවතුම් )**

ලකුණු (2× 20=40)

II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. ඉතිරි ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.

1) ඔබ පන්තිකාමරය තුළදී දෙවෙනි වාරය වෙනුවෙන් සිදුකළ ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබට ඇගයීම සිදුකළ පාඩමේ නම කුමක් ද?
ii. ඇගයීම සිදු කිරීමට පෙර ගුරුතුමා විසින් ඔබට ලබාදුන් උපදෙස් 2ක් ලියන්න.
iii. භූමිකා රංගනය සඳහා යොදාගත් චරිත 2ක් ලියන්න.
iv. එහිදී ඔබට ලැබුණු චරිතය කුමක් ද?
v. භූමිකා රංගනය තුළදී ඔබට ඇතිවූ ගැටලු 2ක් ලියන්න.
vi. භූමිකා රංගනය තුළදී ඔබ ලැබූ අත්දැකීම් 2ක් ලියන්න.
vii. ආදර්ශමත් නායකත්වය පිළිබඳ කියැවෙන ඇගයීමට අදාළ ජාතක කථාව කුමක් ද?
viii. එම ජාතක කථාවෙහි එන ඥානවන්ත නායකයා සතු නායකත්ව ගුණාංග 3ක් ලියන්න.
ix. ශිෂ්‍ය නායකයෙකු , පන්ති නායකයෙකු ලෙස ඔබ තුළ ඇතිකරගත යුතු නායකත්ව ගුණාංග 3ක් ලියන්න.

(ලකුණු 20)

2)
i. පංචශීලයෙහි සඳහන් විරතිය හා සමාදානය කෙටියෙන් පැහැදිලි කරන්න.
ii. පන්සිල් පද අතරින් 3ක් ලියන්න.
iii. පන්සිල් සුරැකීමෙන් සමාජයට වන යහපත වාක්‍ය 5 කින් පැහැදිලි කරන්න.

3)
i. පංචශීලයට අයත් ආජීව අෂ්ටමක ශීලයෙහි අඩංගු නොවන සිල් පදය නම් කරන්න.
ii. ආජීව අෂ්ටමක ශීලයට අයත් පංචශීලයට අයත් නොවන සිල්පද 3ක් ලියන්න.
iii. මිනිසා හා සත්ත්වයා සමාන වන්නේත් අසමාන වන්නේත් කුමන ගති ලක්‍ෂණ වලින් දැයි පැහැදිලි කරන්න.

4)
i. අන්‍යෝන්‍ය යුතුකම් ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද?
ii. එම සූත්‍රයට අනුව ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවිය යුතු යුතුකම් 3ක් ලියන්න.
iii. සිසුන්ගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් 5 ලියන්න.

5)

i. කළගුණ සැළකීමේ අටියෙන් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා තම ජන්ම භූමිය වූ සුනාපරන්තය තෝරා ගත් හිමියන් කවුද?
ii. බුදු රජාණන් වහන්සේ ඉවසීමෙන් කටයුතු කළ අවස්ථා 3ක් ලියන්න.
iii. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉවසීමෙන් ලැබෙන ආනිසංස 5 ලියන්න.

6)

i. නියාම ධර්ම අතරින් දෙකක් නම් කරන්න.
ii. ගිරිමානන්ද සූත්‍රයට අනුව රෝග හටගන්නා ක්‍රම අතරින් තුනක් ලියන්න.
iii. කුසල කර්ම සිදු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න.